# පරීක්ෂක වාර්තාව

අන්තර්මධ්‍ය විභාගය - ජනවාරි 2015

(56) ව්‍යාපාර නීතිය හා කළමනාකරණය

විෂයයේ

**ව්‍යාපාර නීතිය**

(Business Law)

---

ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 6 ක් දක්වා තිබූ අතර ඉන් 5 කට පමණක් පිළිතුරු අපේක්ෂිතය.

## ප්‍රශ්න අංක 01 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

මෙය කෙටි ප්‍රශ්න 5 කින් සමන්විත වූ ලකුණු 10 ක ප්‍රශ්නයකි.

(a) ශ්‍රී ලංකාවේ අභියාචනාධිකාරණයෙන් නිකුත් කළ හැකි පරමාධිකාරී ආඥා වර්ග දෙකක් ලැයිස්තුගත කරන ලෙස දක්වා තිබුණි. එවැනි ආඥා වර්ග කිපයක් තිබුණද මේ පිළිබඳව අයදුම්කරුවන්ට කිසිදු දැනුමක් නොමැති බව දී තිබූ වැරදි පිළිතුරු වලින් පැහැදිලි විය.

(b) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර නීති මූලාශ්‍ර හතරක් සඳහන් කරන ලෙස මේ ප්‍රශ්නයෙන් විමසා තිබුණි. කෙසේවෙතත් බහුතරයක් අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ ව්‍යාපාර නීති මූලාශ්‍ර වෙනුවට සාමාන්‍ය නීති මූලාශ්‍රයන්ය. නමුත් සමහර අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ලබා ගැනීමට සමත් විය.

(c) ගනුදෙනු කළ හැකි ලියවිල්ලක ලක්ෂණ සඳහන් කිරීම පිළිබඳව විමසා තිබූ මෙම ප්‍රශ්නයට බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබුණි.

(d) මෙම කොටසින් විමසූ චෙක්පත් රේඛන වර්ග සඳහාත්, (e) කොටසින් විමසූ කාර්මික ආරවුල් පනතට අනුව, කාර්මික ආරවුල් නිරවුල් කිරීමේ ක්‍රම සම්බන්ධයෙනුත් අයදුම්කරුවන් බහුතරයක් නිවැරදි පිළිතුරු සපයා අදාල මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත්විය.

## ප්‍රශ්න අංක 02 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

ගිවිසුම් නීතිය අනුව වලංගු අර්පණයක අවශ්‍යතා 2 ක් කෙටියෙන් පැහැදිලි කිරීම පිළිතුර වශයෙන් අපේක්ෂා කර තිබුණි. මෙයට බොහෝ අයදුම්කරුවන් සාර්ථක පිළිතුරු සපයා සම්පූර්ණ ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට සමත් විය. මෙහි දෙවන කොටසින් අවස්ථානුකූල ගැටළුවක් ඉදිරිපත් කර තිබුණි. එනම් දෙන ලද අවස්ථාව අධ්‍යයනය කර අනිල්ට තෑග්ග ලැබීමට හිමිකමක් ඇත්දැයි පැහැදිලි කිරීමට අපේක්ෂා කරන ලදී. අනිල් අර්පනයක් ඇති බව නොදැන පොලිසියට තොරතුරු සපයා ඇත. එනම් තෑග්ගක් පිරිනමන බව ඔහු දැන ගත්තේ වරදකරු අත් අඩංගුවට ගැනීමට තොරතුරු සැපයීමෙන් පසුවය. එම නිසා මෙහිදී ප්‍රතිග්‍රහණයක් සිදු වී නොමැත. මෙයින් ඔහුට තෑග්ගක් ලබා ගැනීමට හැකියාවක් නොමැති බව බොහෝ අයදුම්කරුවන් පිළිතුර ලෙස දක්වා සාර්ථක ලෙස ලකුණු ලබා ගැනීමට සමත් විය.

## ප්‍රශ්න අංක 03 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) මෙම කොටසින් පාර්ශව 2 ක් අතර නියෝජ්‍යත්ව සම්බන්ධතාවය ඇතිවිය හැකි ක්‍රම සඳහන් කිරීමට විමසා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් මෙයට නිවැරදි පිළිතුරු දක්වා තිබුණි. එසේම සමහරක් අයදුම්කරුවන් නියෝජනය පිළිබඳ තමා දන්නා සියලුම කරුණු පිළිතුර ලෙසා ලියා තිබුණි.

(b) මෙම කොටසින් ප්‍රධානියා සහ නියෝජිතයා අතර නියොජ්‍යත්වය අවසාන වීම පිළිබඳව අවස්ථානුකූල ගැටළුවක ස්වරූපයෙන් විමසා තිබුණි. කෙසේවෙතත් මේ සම්බන්ධව නිවැරදි පිළිතුර සැපයීමට බොහෝ අයදුම්කරුවන් අසමත් විය. මෙම කරුණ සම්බන්ධයෙන් ඔවුන්ගේ නොදැනුවත්කම දී තිබූ වැරදි පිළිතුරු වලින් මනාව පැහැදිලි විය. උදාහරණයක් ලෙස, කෙසේ හෝ A විසින් ගැනුම්කරුවෙකු සොයා ගත් බැවින් කොමිස් මුදල සඳහා A ට හිමිකමක් ඇත යනුවෙන් ඇතැම් අයදුම්කරුවන් සඳහන් කර තිබුණි.

## ප්‍රශ්න අංක 04 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) භාණ්ඩ විකිණීමේ ආඥා පනත අනුව ගම්‍ය කොන්දේසි 5 ක් නම් කිරීමට විමසා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු දක්වා සාර්ථකව ලකුණු ලබා ගැනීමට සමත් විය.

(b) මෙම කොටසින් විමසා තිබුණේ දී තිබූ අවස්ථාව පිළිබඳ සැලකිලිමත්ව ප්‍රියාගේ නෛතික අයිතිවාසිකම් පිළිබඳව ඇයට උපදෙස් දීමය. මෙහිදී ද භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ අදාල ප්‍රතිපාදනයන්ට අවධානය යොමු කරමින් නිවැරදි පිළිතුරු සපයා තිබුණේ ඉතාමත් සුළු පිරිසකි. මෙහිදී අවධානය යොමුකළ යුතු ප්‍රධාන කරුණ වනුයේ සාමාන්‍යයෙන් විකුණනු ලබන භාණ්ඩ වෙළෙඳාමට සුදුසු තත්ත්වයේ නොපැවතීමයි. නමුත්, බහුතරයක් අයදුම්කරුවන් ඒ පිළිබඳ අවධානය යොමුකිරීමෙන් තොරව විවිධ වූ වැරදි තර්කයන් ඉදිරිපත් කර තිබුණි.

## ප්‍රශ්න අංක 05 - ලකුණු 10

**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

**(a)** හිස්පටසන, "ආදායකයාගේ ගිණුමට පමණයි" සහ යථා කාලයේ දරන්නා යන දෑ කෙටියෙන් පැහැදිලි කිරීමට විමසා තිබුණි. චෙක්පත් සම්බන්ධයෙන් අසා තිබූ මෙම ප්‍රශ්නයට බොහෝ දුර්වල පිළිතුරු සපයා තිබුණි. බහුතරයක් අයදුම්කරුවන්ට "හිස් පටසන" සම්බන්ධයෙන් කිසිදු අදහසක් නොමැති බව, එම ප්‍රශ්නයට පිළිතුරු නොසපයා සිටීමෙන් මනාව පැහැදිලි විය.

**(b)** මෙම කොටසින් විමසා තිබුණේ විනිමය බිල්පතක් ගෙවීම සඳහා ඉදිරිපත් කිරීමේදී අදාල වන නෛතික රීති පිළිබඳවය. මෙම ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු දක්වා සාර්ථකව ලකුණු ලබාගෙන තිබුණි.

**ප්‍රශ්න අංක 06 - ලකුණු 10**
**(තෝරා ගත හැකි ප්‍රශ්නයකි)**

(a) සේවකයෙකු සහ ස්වාධීන කොන්ත්‍රාත්කරුවෙකු වෙන්කොට දැක්වීම වැදගත් වන්නේ කුමක් නිසාද යන්න මෙම ප්‍රශ්නයෙන් විමසා තිබුණි. කෙසේවෙතත්, ප්‍රශ්නය අවබෝධයෙන් කියවීමෙන් තොරව බොහොමයක් අයදුම්කරුවන් සේවකයා සහ ස්වාධීන කොන්ත්‍රාත්කරු අතර වෙනස්කම් දක්වා තිබුණි.

(b) සේවාදායකයා සහ සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට වර්තමානයේ දායක වන ප්‍රතිශත පිළිබඳව විමසා තිබූ මෙම ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් නිවැරදිව පිළිතුරු සපයා තිබුණි.

(c) සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ "මුළු ඉපැයීම්" යන්නට ඇතුලත් වන දෑ පිළිබඳව විමසා තිබූ මෙම ප්‍රශ්නයට බොහොමයක් අයදුම්කරුවන් නිවැරදි පිළිතුරු සපයා තිබුණි. කෙසේවෙතත්, කරුණු 4 ක් නිවැරදිව සටහන් කිරීමට ඔවුන් අසමත් විය.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීම සඳහා සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

1. ප්‍රශ්න පත්‍රය ලබා ගත් වහාම ආරම්භයේ දී ඇති උපදෙස් හොඳින් සැලකිලිමත්ව කියවා තෝරා ගතහැකි ප්‍රශ්න මොනවාද යන්න පිළිබඳව අවබෝධ කර ගත යුතුය.
2. ප්‍රශ්නය කීපවරක් හොඳින් කියවා මැනැවින් අවබෝධ කර ගෙන අසා ඇති කරුණු වලට පමණක් පිළිතුරු සැපයිය යුතුය. අදාල නොවන කරුණු ඇතුලත් නොකළ යුතුය.
3. පිළිතුරු සැපයීමේදී කාලය බෙදාගැනීම පිළිබඳව සැලකිලිමත් විය යුතුය.
4. උත්තර පත්‍ර භාර දීමට පෙර විභාග ශාලාවේදී ප්‍රශ්න අංක හා තමන්ගේ විභාග අංකය නිසිපරිදි යොදා ඇත්දැයි පරීක්ෂා කර බැලීම.
5. අත්අකුරු පැහැදිලිව ලිවීම මගින් පරීක්ෂකවරයාට උත්තර පත්‍රය කියවා හොඳින් අවබෝධ කරගැනීමට සැලැස්වීමෙන් උපරිම ලකුණු ප්‍රමාණය ලබා ගැනීමට හැකිවනු ඇත.
6. දැනුම යාවත්කාලීන කර ගැනීම සඳහා අළුතින් නිකුත් කරන සඟරා, පුවත්පත්, අත්පොත්, පාඨ ග්‍රන්ථ නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතු වේ.
7. පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

\- * * * -